දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය - පේරාදෙණිය විශ්වවිද්‍යාලය
தொடர் தொலைக் கல்வி நிலையம் - பேராதனைப் பல்கலைக்கழகம்
CENTRE FOR DISTANCE & CONTINUING EDUCATION – UNIVERSITY OF PERADENIYA

# 200 Level Examination in Bachelor of Arts (External New Syllabus)
# (January 2020)
## ECNE 202: සාර්ව ආර්ථිකවිද්‍යා න්‍යාය

උපදෙස්:

කාලය පැය (03) තුනක් පමණයි
ඕනෑම ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න
ගණක යන්ත්‍ර භාවිතා කලහැක
එක් එක් ප්‍රශ්නය සඳහා ලකුණු ලබාදීම පෙන්නුම් කර ඇති පරිදිවේ
මෙම ප්‍රශ්න පත්‍රය සඳහා අඩංගු මුළු ප්‍රශ්න සංඛ්‍යාව 08

---

1. සාර්ව ආර්ථික අරමුණු කෙටියෙන් විස්තර කර ඒවා අතර පැවතියහැකි ගැටීම් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 20)

2. (i) සංවර්ධනයවෙමින් පවතින රටවල ජාතික ආදායම මිණුම් කිරීමේ ප්‍රධාන අපහසුතාවයන් ශ්‍රී ලංකාව ආශ්‍රයෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 12)

   (ii) ආර්ථික කාර්ය සාධනය සහ ශුභ සාධනය මිණුම් කිරීම සඳහා ද.ජා.නි. (GDP) මානයක් ලෙස භාවිතා කිරීමේදී ඇතිවන මැනීමේ සහ සංකල්පමය ගැටළු මොනවාද? (ලකුණු 08)

3. පහත දැක්වෙන තොරතුරු මගින් පෙන්නුම් කෙරෙන ආර්ථිකය සලකන්න.

| | |
|---|---|
| පරිභෝජන වියදම | $C = 150 + 0.8Y^d$ |
| ආයෝජන | $I = 500 - 5000r$ |
| බදු අනුපාතිකය | $tY = 0.25Y$ |
| රජයේ වියදම | $G = 200$ |
| මූර්ත මුදල් ඉල්ලුම | $L = 200 + 0.4Y - 2000r$ |
| මූර්ත මුදල් සැපයුම | $\frac{M}{P} = 700$ |

(Y මගින් ආදායමද, $Y^d$ මගින් වැයකලහැකි ආදායමද, r මගින් පොලී අනුපාතිකයද දැක්වේ. r සහ t හැර අනෙකුත් සියළු විචල්‍යයන්හි වටිනාකම් රු. මිලියන වලිනි)

   (i) IS වක්‍රය අර්ථදක්වා, IS සමීකරණය ව්‍යුත්පන්න කරන්න (ලකුණු 05)
   (ii) LM වක්‍රය අර්ථදක්වා, LM සමීකරණය ව්‍යුත්පන්න (ලකුණු 05)
   (iii) සමතුලිත ආදායම් මට්ටම (Y) සහ පොලී අනුපාතිකය (r) තීරණය කරන්න (ලකුණු 05)
   (iv) ප්‍රසාරණාත්මක පිස්කල් ප්‍රතිපත්තියක් IS-LM සමතුලිතය කෙරෙහි බලපාන්නේ කෙසේද? (ලකුණු 05)

4. ආර්ථිකයක කෙටි කාලීන නිෂ්පාදන ශ්‍රිතය $Y = 700 + 4N - 0.01N^2$ ලෙස සිතන්න. ශ්‍රම ඉල්ලුම් සමීකරණය $N^d = 200 - 50\frac{W}{P}$ ලෙස සහ ශ්‍රම සැපයුම් සමීකරණය $N^s = -300 + 100W$ ලෙස දී ඇත. ආර්ථික කටයුතු ආරම්භක අවස්ථාවේදී රු. 1000 ක පූර්ණ සේවානියුක්ති නිෂ්පාදන මට්ටමක සහ මිල මට්ටමක (p) රු. 2/= ලෙස පවතී.

(i) ශ්‍රම වෙළඳපල සමතුලිත සොයන්න (ලකුණු 05)

(ii) පහත දැක්වෙන ඒවා ඇස්තමේන්තු කරන්න

a. සේවානියුක්ත ශ්‍රම ඒකක ප්‍රමාණය (ලකුණු 05)

b. මිල මට්ටම (ලකුණු 05)

c. රාජ්‍ය වියදම් ඉහලයාම නිසා මූර්ත නිමැවුම රු. 1075 දක්වා වැඩිවූවිට මූර්ත වැටුප් අනුපාතිකය (ලකුණු 05)

5. (i) IS-LM රූප සටහනක් භාවිතා කරමින් සමස්ථ ඉල්ලුම් (AD) වක්‍රය ව්‍යුත්පන්න කරන්න (ලකුණු 05)

(ii) සමස්ථ ඉල්ලුම් (AD) වක්‍රය විතැන්වීමට බලපාන හේතු මොනවාද? (ලකුණු 05)

(iii) නවසම්භාව්‍ය සමස්ථ සැපයුම් (AS) වක්‍රය සහ කේන්සියානු සමස්ථ සැපයුම් (AS) වක්‍රයෙහි වෙනස ඔබ විස්තර කරන්නේ කෙසේද? (ලකුණු 10)

6. (i) මහ බැංකුවක ප්‍රධාන අරමුණු මොනවාද? (ලකුණු 05)

(ii) එම අරමුණු ඉටුකර ගැනීම සඳහා ප්‍රතිපත්ති උපකරණයක් ලෙස මහ බැංකුව පොලී අනුපාතිකය භාවිතාකරන ආකාරය සාකච්ඡා කරන්න (ලකුණු 15)

7. (i) කේන්සියානු පරිභෝජන ශ්‍රිතයෙහි මූලික උපකල්පන මොනවාද? එම උපකල්පන සංගතවන සහ සංගතනොවන බවට පවතින කරුණු/සාක්ෂි විස්තර කරන්න (ලකුණු 10)

(ii) ජීවන චක්‍ර උපන්‍යාසය (Life cycle hypothesis) සහ ස්ථිර ආදායම් උපන්‍යාසය (Permanent income hypothesis) මගින් පාරිභෝගික හැසිරීම පිළිබඳ ඉහත (i) හි කරුණු/සාක්ෂි පහදා දෙන්නේ කෙසේද? (ලකුණු 10)

8. පහත දැක්වෙන ඕනෑම සංකල්ප යුගල <u>හතරක</u> වෙනස සැසඳීමක් කරන්න

(i) පිරිවැයෙන්-තල්ලුවුනු උද්ධමනය සහ ඉල්ලුමෙන්-ඇදුනු උද්ධමනය

(ii) මූර්ත පොලී අනුපාතිකය සහ නාමික පොලී අනුපාතිකය

(iii) ඉච්ඡානුගත සේවාවියුක්තිය සහ අනිච්ඡානුගත සේවාවියුක්තිය

(iv) පිස්කල් ප්‍රතිපත්ති ගුණකය සහ තුලිත අයවැය ගුණකය

(v) කෙටිකාලීන පිලිප්ස් වක්‍රය සහ දිගුකාලීන පිලිප්ස් වක්‍රය

(vi) මුදල් තැන්පතු අනුපාතිකය සංචිත තැන්පතු අනුපාතිකය

(vii) ස්වාධීන වියදම් සහ පෙලඹවුනු වියදම්

(එක් කොටසකට ලකුණු 05 බැගින්)

****************************************